ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක: 08/2020

මගේ අංකය: HA/0/16/28
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිල මැදුර, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05
2020.03.12

සියළුම දිස්ත්‍රික් ලේකම් වරුන්/ ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත,

**සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගී කරවීම.**

සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි කාර්ය සාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන්ම සේවාලාභීන් සඳහා වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා යොමු විය යුතු බව දන්වමි.

02. ඒ අනුව සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරනු ලබන ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා අයදුම් කර එම තරඟයට සහභාගී වීමට අවශ්‍ය ඉල්ලුම්පත්‍ර මාර්තු මස නිම වීමට ප්‍රථම ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. ඉදිරියේ දී පවත්වනු ලබන සියළුම ඵලදායිතා ප්‍රවර්ධන තරඟ සඳහා ද සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහාභාගී විය යුතු බව ද දන්වමි.

03. තවද, එම ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්වලින් ලබා ගන්නා ප්‍රගතිය කාර්ය සාධන ඇගයීම් වලදී මෙන්ම දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන බව ද කාරුණිකව දන්වමි.

එස්.හෙට්ටිආරච්චි
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

Scanned with CamScanner